**කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**
**ශාස්ත්‍ර පීඨය**

**ශාස්ත්‍රවේදී සිව්වන වසර පරීක්ෂණය - පළමුවන සෙමෙස්තරය – 2018/2019**

**SOC 4178 – වෛද්‍ය සමාජ විද්‍යාව**

**පැ දෙකයි (02)**

**ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.**

---

1. 'වෛද්‍ය සමාජ විද්‍යාව විෂයධාරාවක් වශයෙන් සංවර්ධනය වූයේ සෞඛ්‍ය හා රෝගීත්වය පිළිබඳ ජෛව වෛද්‍ය ප්‍රවේශයේ සීමාවන් සම්බන්ධයෙන් මතු වූ විවේචන හේතු කොට ගෙනයි.' යෝග්‍ය නිදර්ශන ඇසුරෙන් මෙම ප්‍රකාශය විවේචනාත්මකව විභාග කරන්න.

2. පුද්ගල ජීවන චක්‍රයේ විවිධ අදියර වර්තමාන සමාජය තුළ වෛද්‍යකරණයට ලක් වී ඇත්තේ කෙසේදැයි දේශපාලන ආර්ථික පර්යාලෝකය ඇසුරෙන් විවේචනාත්මකව විභාග කරන්න.

3. සෞඛ්‍ය පිළිබඳ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අසමානතා වටහා ගැනීම සඳහා ස්ත්‍රීවාදී පර්යාලෝකවල ඇති වැදගත්කම විභාග කරන්න.

4. **<u>එක්කෝ</u>**

ශ්‍රී ලංකාවේ බහුත්ව වෛද්‍ය ක්‍රමයේ විවිධ ලක්ෂණ මානවවංශ වෛද්‍ය පර්යාලෝකය ඇසුරින් පැහැදිලි කරන්න.

**<u>නැතහොත්</u>**

ශ්‍රී ලංකාවේ බහුත්ව වෛද්‍ය ක්‍රමය කෙරෙහි විශේෂ අවධානය සහිතව සෞඛ්‍ය සංරක්ෂණයේ ජන (Folk), ජනප්‍රිය (Popular) හා වෘත්තීමය (Professions) අංශවල විශේෂ ලක්ෂණ පැහැදිලි කරන්න.

*ඇ.පි.බ.*

5. කාර්මික සමාජවල සමාජ පාලන යන්ත්‍රණයක් වශයෙන් වෛද්‍ය පද්ධතියේ භූමිකාව කෘත්‍යවාදි පර්යාලෝකය ඇසුරෙන් විභාග කරන්න.

6. පහත සඳහන් මාතෘකා අතුරින් ඕනෑම **<u>දෙකක් (02)</u>** පිළිබඳ කෙටි රචනා ලියන්න.

(i) සෞඛ්‍ය හා සම්බන්ධ සමාජ නිශ්චායක

(ii) මානසික රෝග හා බැඳුණු සමාජ කැළල හා වෙනස්කොට සැලකීම

(iii) ජීවන ශෛලියේ වෙනස්කම් හා බෝ නොවන රෝග වර්ධනය වීමේ ප්‍රවනතාව

(iv) සතුට හා යහපැවැත්ම (Happiness and well-being)

*****************